| | | | |
|---|---|---|---|
| පිළියන්දල අධ්‍යාපන කලාපය<br>**Education Zone - Piliyandala** | | | |
| වර්ෂ මැද ඇගයීම - 2017<br>**Mid Year Evaluation** | | | |
| ශ්‍රේණිය / **Grade** } 06 | විෂයය / **Subject** } බුද්ධ ධර්මය | පත්‍රය / **Paper** } I | කාලය / **Time** } පැය 02යි |

නම ..............................................  විභාග අංකය ..............................

සැළකිය යුතුයි:

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 15 තෙක් ප්‍රශ්නවල දී ඇති පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01) " මෙයින් අවුරුදු දහසක් ඉකුත් වූ කල බුදු කෙනෙකුන් උපදිනවාය" දෙවියන් විසින් හඬ නගා කියමින් ඇවිදීම හඳුන්වන්නේ,

1. දෙව් ගැටුම
2. බුද්ධෝත්පත්තිය
3. පංච මහා විලෝකන
4. බුද්ධ කෝලහලය

02) සිදුහත් කුමරුගේ මව වනුයේ,

1. ප්‍රජාපතී ගෝතමී දේවිය
2. යසෝදරා දේවිය
3. කිසාගෝතමී දේවිය
4. මහාමායා දේවිය

03) සුද්ධෝදන රජතුමාගේ ගුරුවරයා වූයේ,

1. සර්ව මිත්‍ර බමුණා ය
2. සච්චකාර බමුණා ය
3. අසිත තාපසතුමා ය
4. කොණ්ඩඤ්ඤ තවුසා ය

04) බෝසත් කුමරුගේ නම් තැබීමේ මංගල්‍යයට පඬිවරු කී දෙනෙක් සහභාගි වූයේද?

1. 102 2. 108 3. 118 4. 08

05) සතර පෙර නිමිති වලට අයත් නොවන්නකි,

1. මහල්ලෙක් 2. ලෙඩෙක් 3. කාන්තාවක් 4. පැවිදි රුවක්

06) සිදුහත් කුමරු පළමුවරට වැඩූ භාවනාව වන්නේ,

1. මෛත්‍රී භාවනාව යි
2. ආනාපානසති භාවනාව යි
3. බුද්ධානුස්සති භාවනාව යි
4. සක්මන් භාවනාව යි

07) සිදුහත් බෝසතාණන් වහන්සේ ගිහි ගෙය හැර ගියේ,

1. වෙසක් පොහොය දිනකදී ය
2. පොසොන් පොහොය දිනකදී ය
3. ඇසළ පොහොය දිනකදී ය
4. දුරුතු පොහොය දිනකදී ය

08) බුදුරජාණන් වහන්සේ කැඩපත උපමාවට ගෙන ධර්මය දේශනා කළේ,

1. සෝපාක හිමිට ය
2. නන්ද හිමිට ය
3. රාහුල හිමිට ය
4. සැරියුත් හිමිට ය

09) දියුණුවේ දොරටුවක් නොවන්නේ,

1. නීරෝගී බව ය
2. සිල්වත් බව ය
3. කම්මැළි බව ය
4. දැහැමිව ජීවත් වීම ය

10) ශීල ශික්ෂාවට අයත් මාර්ග අංගයක් වන්නේ,

1. සම්මා දිට්ඨියයි
2. සම්මා ආජීවයයි
3. සම්මා සමාධියයි
4. සම්මා සංකල්පයයි

11) ගිහියන් විසින් නිතිපතා රකින සීලය වනුයේ,

1. අටසිල් ය
2. දසසිල් ය
3. පංච සීලයයි
4. ප්‍රාතිමෝක්ෂ සංවර සීලයයි

12) සිඟාලෝවාද සූත්‍රයේදී දෙමව්පියන් උපමා කර ඇත්තේ කුමන දිශාවටද?

1. උතුරු දිශාවට
2. නැගෙනහිර දිශාවට
3. බටහිර දිශාවට
4. දකුණු දිශාවට

13) වචනයෙන් සිදුවන වැරදි ක්‍රියාවක් නොවන්නේ,

1. බොරු කීම
2. කේලාම් කීම
3. පරුෂ වචන කීම
4. සොරකම් කිරීම

14) බුදුරජාණන් වහන්සේ රාහුල හාමුදුරුවන්ට කිසියම් ක්‍රියාවක් හොඳද නරක දැයි මැන බැලීම සඳහා දේශනා කරන ලද සූත්‍රය වන්නේ,

1. චුල්ල රාහුලෝවාද සූත්‍රයයි
2. සිඟාලෝවාද සූත්‍රයයි
3. අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයයි
4. කරණීය මෙත්ත සූත්‍රයයි

15) දරුවන්ගේ දියුණුව දැක දෙමාපියන් ලබන සතුට,

1. මුදිතාව නම් වේ
2. මෛත්‍රී නම් වේ
3. කරුණාව නම් වේ
4. උපේක්ඛා නම් වේ

අංක 16 සිට 20 දක්වා වගන්ති හරි නම් (√ ) ලකුණද වැරදි නම් ( x ) ලකුණද ඉදිරියෙන් ඇති හිස්තැනෙහි යොදන්න.

16) බෝසතාණන් වහන්සේ මාස හයක් දුෂ්කර ක්‍රියා කළහ. ( )

17) මෛත්‍රී භාවනාව වැඩීමේදී මුලින්ම මෛත්‍රිය පැතිර විය යුත්තේ තමන් වෙතයි. ( )

18) වෙනස්වීම් මේ ලොව කාටත් උරුම වූ ධර්මතාවයකි. ( )

19) සතුන් මැරීම කයින් සිදු කරනු ලබන වැරදි ක්‍රියාවකි. ( )

20) ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය වනුයේ ඕලු මල ය ( )

| | | | |
|---|---|---|---|
| පිළියන්දල අධ්‍යාපන කලාපය<br>Education Zone - Piliyandala | | | |
| වර්ෂ මැද ඇගයීම - 2017<br>Mid Year Evaluation | | | |
| ශ්‍රේණිය<br>Grade } 06 | විෂයය<br>Subject } බුද්ධ ධර්මය | පත්‍රය<br>Paper } II | |

නම .............................................. විභාග අංකය ...................

සැළකිය යුතුයි:

- පළමුවන ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

01) දෙවන වාරය වෙනුවෙන් ඔබ නිම කළ ඇගයීම ඇසුරෙන් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. දෙවන වාරය සඳහා ඔබට ලැබුණු ඇගයීම කුමක්ද? (ලකුණු 02)
ii. එම ඇගයීමේදී ඔබ කළ නිර්මාණයට ලබා දුන් මාතෘකාව කුමක්ද? (ලකුණු 02)
iii. එම ඇගයීම සඳහා ඔබ යොදා ගත් පාඩම් දෙකෙහි මාතෘකා මොනවාදැයි ලියන්න (ලකුණු 04)
iv. එය ක්‍රියාත්මක කිරීමේදී ඔබට ලැබුණු ගුරු උපදෙස් දෙකක් ලියන්න (ලකුණු 02)
v. ශ්‍රී ලංකාවේ ජාතික ගීයේ නිර්මාතෘවරයා කවුද? (ලකුණු 02)
vi. ජාතික කොඩියෙහි සංකේත අතරින් තුනක් ලියන්න. (ලකුණු 03)
vii. මඝ මානවක ඇතුලු පිරිස ආරක්ෂා කළ ප්‍රතිපත්ති තුනක් නම් කරන්න (ලකුණු 03)

02) i. සිද්ධාර්ථ තාපසතුමා ධර්මය ඉගෙන ගැනීම සඳහා ගිය ගුරුවරු දෙදෙනෙකු නම් කරන්න (ලකුණු 02)
ii. බුද්ධත්වයට පත් වීමේදී බුදුරජාණන් වහන්සේ ලැබූ ඥාන තුන ලියන්න (ලකුණු 04)
iii. පංච මහා විලෝකන නම් කරන්න. (ලකුණු 05)

03) i. අභිනිෂ්ක්‍රමණය යනුවෙන් අදහස් වන්නේ කුමක්ද? (ලකුණු 02)
ii. ත්‍රිවිධ චෛත්‍යය නම් කරන්න. (ලකුණු 04)
iii. මෛත්‍රී භාවනාව වැඩීමේ ආනිසංස පහක් ලියන්න. (ලකුණු 05)

04) i. සීලය යනු කුමක්ද? (ලකුණු 02)
ii. පංච සීලයට අයත් මුල් ශික්ෂා පද තුන ලියන්න. (ලකුණු 04)
iii. සිල්වත්ව කටයුතු කිරීමෙන් ලැබෙන ආනිසංස පහ ලියන්න (ලකුණු 05)

05) i. වචනයෙන් සිදුවන වැරදි දෙකක් ලියන්න. (ලකුණු 02)
ii. ත්‍රිකෝටි පාරිශුද්ධි සීලය නම් කරන්න. (ලකුණු 04)
iii. විහාරස්ථානයකදී ඔබ විසින් සිදු කළ යුතු වත් පිළිවෙත් පහක් ලියන්න. (ලකුණු 05)

06) i. බුදුරජාණන් වහන්සේ සිඟාලෝවාද සූත්‍රය දේශනා කළේ කාටද? (ලකුණු 02)
ii. සිව් බඹ විහරණවලින් තුනක් නම් කරන්න. (ලකුණු 04)
iii. සිඟාලෝවාද සූත්‍රයට අනුව මවුපියන් විසින් දරුවන්ට ඉටු කළ යුතු යුතුකම් 05ක් ලියන්න (ලකුණු 05)

07) i. අනිත්‍යතාව යනු කුමක්ද? ඔබේ වචනයෙන් ලියන්න (ලකුණු 02)
ii. " න තං කම්මං කතං සාධු " යන ගාථාව සම්පූර්ණ කරන්න (ලකුණු 04)
iii. එහි තේරුම ලියන්න. (ලකුණු 05)